# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.01 පැය 1850 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/618/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් නිලධාරියෙකු සමග ඇතිවූ පොර බැදීමකදී වෙඩි වැදීමක් හේතුවෙන් පුද්ගලයෙකු තුවාල ලැබීම - ගම්පහ පොලිස් වසම.**

2025.04.01 වන අද දින දහවල් කාලයේ ගම්පහ පොලිස් වසමේ උග්ගල්බඩ ප්‍රදේශයේදී, ගම්පහ කොට්ඨාස අපරාධ විමශර්න කායර්ංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන බවට ලද තොරතුරක් මත ක්ෂණික මාගර් බාධක යොදා යතුරුපැදියකින් පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු පරීක්ෂා කිරීමට යාමේදී යතුරුපැදිය නොනවත්වා ධාවනය කර ඇත. පලාගිය යතුරුපැදිය පසුපස පොලිස් නිලධාරියෙකු යතුරුපැදියෙන් ලුහුබැඳ ගොස් සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට යාමේදී නිලධාරියාගේ ගිනි අවිය උදුරා ගැනීමට උත්සහ කිරීමේදී ඇතිවූ පොරබැදීම හේතුවෙන් නිලධාරියාගේ රාජකාරී ගිනි අවිය ක්‍රියාත්මක වීමෙන් එක් සැකකරුවෙකුගේ පාදයට වෙඩි වැදීමෙන් තුවාල ලබා ගම්පහ රෝහලට ඇතුලත් කර ඇත. තුවාලකරු අත්අඩංගුවට ගෙන පොලිස් ආරක්ෂාව යටතේ ප්‍රතිකාර ලබන අතර අනෙක් සැකකරු අත්අඩංගුවට ගෙන වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**තුවාලකරු වයස අවුරුදු 27 ක් වන මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර අත්අඩංගුවට ගත් අනෙක් සැකකරු වයස අවුරුදු 21 ක් වන උග්ගල්බඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෙම පලාගිය සැකකරුවන් ගමන් කල යතුරුපැදිය පරික්ෂා කිරීමේදී එහි තිබී අයිස් මත්ද්‍රව්‍ය හා තුවාලකරු සන්තකයේ තිබී හෙරොයින් මත්ද්‍රව්‍ය සොයා ගෙන ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගම්පහ පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**